සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - 2010/11

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2011 මාර්තු 31 දිනට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් තුල මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර විගණනය සඳහා ඉදිරිපත් කලයුතු වුවත් 2010/2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණේ 2011 නොවැම්බර් 14 දිනය.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදි පළාත් සභා 04 කට අදාල පිරිවැටුම් බදු රු.132,318 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ආ) පළාත් සභා 03 ක් වෙනුවෙන් වූ රු.1,392,693 ක පිරිවැටුම් බදු ගෙවා නොතිබුණු අතර ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවලද දක්වා නොතිබුණි.

(ඇ) කුරුණෑගල ගබඩාව වෙත ප්‍රවාහනය කිරීමේදි යූරියා පොහොර තොග මෙට්‍රික් ටොන් 4.5 හානිවී තිබුණු අතර මෙම හානි වූ තොගය ගිණුම්ගතකර නොතිබුණි.

### 1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අලෙවි අංශයේ වාර්තාවන් අනුව සමස්ථ විකුණුම් වටිනාකම රු.1,070,330,373 ක් වූ මෙට්‍රික්ටොන් 166,399 ක් වුවත් , මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.1,066,854,564 ක් වූ මෙට්‍රික්ටොන් 165,867 ක් වූ වුයෙන් දළ වශයෙන් මෙට්‍රික්ටොන් 532 ක් වූ රු.3,475,809 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ණයගැති ලෙජරයේ ශේෂයන් සහ ශේෂ සනාථ කිරීම් අතර වටිනාකම රු.2,431,777 ක් වූ නොසැසඳීම් අවස්ථා 17 ක් නිරීක්ෂණය විය.

### 1.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයට පෙර අවස්ථා 19 කදී වටිනාකම රු.235,574 ක් වූ අත්තිකාරම් ලබාදී තිබුණු අතර එම අත්තිකාරම් 2011 අගෝස්තු 31 දිනතෙක්ම පියවා නොතිබුණි.

(ආ) 1994 වර්ෂයට පෙර සිට පැවත එන ණයගැතියන් 23 දෙනෙකුට අදාල රු.23,706,125 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවක ණය ශේෂය තුල සේවය හැරගිය, සේවය අත්හිටවනු ලැබූ හා වැඩ තහනමට ලක්වූ සේවකයන්ගෙන් අයකරගත යුතු ණය වටිනාකම රු.3,546,999 ක් විය.

(ඈ) 2009/2010 වර්ෂයේ සිට ගෙවිය යුතු ආදායම් බදු ගිණුමේ රු.4,882,055 ක හර ශේෂයක් පවතින අතර මෙම ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ඉඩම් | 90,000,000 | අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු හෝ වෙනත් ඒ හා සම්බන්ධ ලියකියවිලි |
| (ආ) ණයගැතියන් | 55,500,568 | ශේෂ සනාථ කිරීම් |

## 1.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත | 2004/2005 තක්සේරු වර්ෂයේ සිට 2009/2010 තක්සේරු වර්ෂය දක්වා ගෙවිය යුතු ආදායම් බදු වටිනාකම රු.54,622,270 ක් වූ අතර 2011 මාර්තු 31 දින වන විට ගෙවන ලද බදු වටිනාකම රු.31,446,295 ක් විය. තවදුරටත් ගෙවියයුතු බදු මුදල රු.23,175,975 ක් වුවත් සමාලෝචිත වර්ෂයට ගෙවියයුතු ආදායම් බදු වශයෙන් රු.10,664,726 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |
| (ආ) | ආයතන සංග්‍රහය | |
| | I. VIII පරිච්ඡේදයේ 4.1 වගන්තිය | මාණ්ඩලික නිළධාරීන්ට අතිකාල දීමනාව සඳහා හිමිකම් නොමැති නමුත් සමාලෝචිත වර්ෂයේදී මාණ්ඩලික නිළධාරීන් සඳහා අතිකාල දීමනා ලෙස රු.76,989 ක් ගෙවා තිබුණි. |
| | II. VIII පරිච්ඡේදයේ 10 (1) වගන්තිය හා 1997 පෙබරවාරි 3 දිනැති අංක 7/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | i. සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනයන්හි මාසයකට දින එකකට වඩා වැඩි දින ගණනක් අනුමැතියකින් තොරව වැඩ කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.667,846 ක් ගෙවීම් කර තිබුණි.<br>ii. මූලික වැටුප පදනම් කරගෙන 1/20 දීමනාව ගණනය කළයුතු වුවත් මූලික වැටුප, ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනාවෙන් සමන්විත වැටුප මත දීමනා ගණනය කර තිබුණි. |
| (ඇ) | රජයේ මුදල් රෙගුලාසි | |
| | I. මු.රෙ. 104(3) හා (4) සහ මු.රෙ. 1642 | සමාගමේ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා අවසන් වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | වාහන අනතුරු සම්බන්ධයෙන් ළගම ඇති පොලීසියට වාර්තා කලයුතු වුවත් එසේ නොව අවස්ථා 02 ක් නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. |
| | II. මු.රෙ.371.2 (අ) | එක් අවස්ථාවකදී නිකුත් කලයුතු තත්කාර්ය අග්‍රිම වටිනාකම රු.20,000 ට වැඩි නොවිය යුතු වුවද අවස්ථා 16 කදී එම සීමාව ඉක්මවා රු.891,100 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| | III. මු.රෙ.387 | ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනිමට නොහැකි වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී ලබාගත් අයිරා පහසුකම් වෙනුවෙන් රු.478,088 ක පොලී ගෙවා තිබුණු අතර 2011 මාර්තු 31 දිනට බැංකු ජංගම ගිණුමේ පැවති අයිරා ශේෂය රු.77,233 ක විය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | I. 8.3.3 වගන්තිය හා කලමනාකරණ සේවා චක්‍රලේඛ අංක 42 | පැමිණීම සහ කාර්යසාධනය මත පදනම් නොවී සමාලෝචිත වර්ෂයේදී දිරි දීමනා ලෙස රු.7,250,187 ක මුදලක් ගෙවා තිබුණි. |
| | II. 9.3.1 ජේදය | සමාලෝචිත වර්ෂයේදී බඳවාගැනිමේ පටිපාටියකින් තොරව නව බඳවා ගැනීම් 10 ක් සිදුකර තිබුණි. |
| (ඉ) | 2000 ජුනි 27 දිනැති අංක:පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු හා 2000 මැයි 02 දිනැති අංක:බිඩී/පීඊ/3/2000 දරන රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛ | රාජ්‍ය සමාගම්වල මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමට පෙර අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගතයුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනිමෙන් තොරව රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල රු.436,672,462 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඊ) | 2009 ඔක්තෝම්බර් 30 දිනැති අංක 4/5/1 දරන ජාතික පොහොර ලේකම් කාර්යාල චක්‍රලේඛය | සහනාධාර පොහොර ණය පදනම මත අලෙවි කල නොහැකි නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.9,276,223 ක් වටිනා පොහොර ණයට විකුණා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම්වලින් රු. 326,513,860 ක බදු පෙර ශුද්ධ ලාභයක්වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. 935,118,273 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.608,604,413 ක පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මල්‍ය ප්‍රතිඵල විවිධ අදියරයන් යටතේ පහත වගුවෙන් දැක්වේ.

| | මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|
| | 2011 | 2010 |
| | රු. | රු. |
| (අ) දළ ලාභය | 533,220,673 | 1,285,538,043 |
| (ආ) බදුවලට පෙර ශුද්ධ ලාභය | 326,513,860 | 935,118,273 |
| (ඇ) බදුවලට පසු ශුද්ධ ලාභය | 210,630,411 | 651,559,658 |

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 පොහොර ප්‍රවාහනය සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). අවශ්‍ය කොන්දේසි සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලද ආයතන 12කට ප්‍රවාහන කටයුතු භාරදී තිබූ අවස්ථා නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.

(ආ). 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කර නොතිබුණ ප්‍රවාහන ආයතන 58 ක් සකස්කර තිබුණු පොරොත්තු ලේඛනයට ඇතුළත් කර තිබුණි.

(ඇ). ගිවිසුම්වලට එළඹීමට ප්‍රථම ප්‍රවාහන කටයුතු භාරදී තිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර එසේ ප්‍රවාහනය කිරීමේදී පොහොර තොග අයථා ලෙස වෙනත් පාර්ශවයන්ට විකිණීමට තැත්කල අවස්ථාද නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.

(ඈ). ටෙන්ඩර් ලබා දෙන සැපයුම්කරු ඒ ඒ දිස්ත්‍රික්ක අනුව රු.200,000 හා රු.400,000 අතර මුදලක් කාර්ය සඵලතා බැඳුම්කර ලෙස තැබිය යුතු නමුත් එසේ ඇප තබා නොමැති අවස්ථා නිරීක්ෂණය වූ අතර ඒ වෙනුවට සේවා සපයන ආයතන වලට ගෙවිය යුතු මුදලින් 10% බැගින් අඩුකර ඇප මුදල් සම්පූර්ණ කර ගැනිමට යටත්ව ආයතන දෙකක් සමග ගිවිසුම් වලට එළඹ තිබුණි.

## 2.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදි හම්බන්තොට ගබඩාවක් ඉදිකිරීමට සැලසුම් සකස් කිරිම සඳහා රු.253,173 ක මුදලක් වියදම් කර තිබුණ අතර වෙන්කර තිබූ භූමිය වෙනුවට වෙනත් ස්ථානයක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බව දන්වා තිබුණද 2011 දෙසැම්බර් 31 තෙක්ම එම කටයුතු සිදු වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගබඩාවක් ඉදිකිරීම සඳහා ඉඩම් සුද්ද කිරිමට වැය කල රු.39,000 ක් කෙරිගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණද එම ඉඩම පවරා ගැනිමට 2011 දෙසැම්බර් 31 තෙක්ම සමාගමට හැකි වී නොතිබුණි.

## 2.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවුරුදු 07 කට වඩා පැරණි රු.36,062,867 ක් වන ණයගැතියන් 65 දෙනෙකුගෙන් රු.7,197,644 ක් වන ණයගැතියන් 09 කට අදාළව පමණක් නිතිමය පියවර ගෙන තිබුණි.

(ආ) නතිමය පියවර ගන්නා ලද ණයගැතියන් 04 දෙනෙකු සම්බන්ධව පරීක්ෂා කිරිමේදි ආයතනය අනුගමනය කර ඇති ක්‍රියාමාර්ගයන් සතුටුදායක මට්ටමක නොපැවතුණි. විස්තර පහත දැක්වේ.

(i) විවිධ සේවා සමුපකාර සමිතියකින් අයවිය යුතු රු.300,000 ක මුදල අයකර අදාල නඩුව අවසන් වී ඇති බව දන්වා තිබුණ ද තව දුරටත් රු.96,126 මුදලක් අයවිමට තිබුණි.

(ii) ණයගැතියෙකුගෙන් අයවිය යුතු මුදල රු.2,672,073 ක් වුවද රු.2,550,906 ක මුදලක් පමණක් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි.

(iii) නතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ණයගැතියෙකුගෙන් අයවිය යුතු රු.287,160ක මුදලට අදාල ලිපි ගොනුව වසා දමා තිබුණි.

(iv) ණයගැතියෙකුගෙන් අයවිය යුතු රු.254,800 ක මුදලට අදාලව 2008 අගෝස්තු 10 දිනෙන් පසු කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 04 දින සිට 2011 ජනවාරි 26 දින දක්වා වූ කාලය තුල අවස්ථා 63 කදී ගොවිජන සේවා මධ්‍යස්ථානයක් වෙත සපයා ඇති පොහොර තොග වෙනුවෙන් භාණ්ඩ භාර ගැනීමේ තුණ්ඩු ඉදිරිපත් කර නොතිබුණු අතර එම ලැබීම් සනාථ කිරීම සඳහා 2011 මාර්තු 25 දිනැති ලිපියක් පමණක් නිකුත්කර තිබුණි.

(ඈ) 2010 යල කන්නය තුලදී ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදාහැරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් අනුමත කරන ලද පොහොර ප්‍රමාණයන් ඉක්මවා පොහොර මෙට්‍රික් ටොන් 491.07 ක් බෙදා හැර තිබුණි.

(ඉ) 2010/2011 මහ කන්නය සඳහා දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත යූරියා පොහොර මෙට්‍රික් ටොන් 1,689.10 ක් බෙදාහැරීමට අනුමත කර තිබුණත් එම ප්‍රමාණය ඉක්මවා යූරියා පොහොර මෙට්‍රික් ටොන් 12 ක් නිකුත් කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් වෙත පොහොර මෙට්‍රික් ටොන් 7.7 ක් අනුමත සීමාව ඉක්මවා නිකුත් කර තිබුණි.

(උ) ලංකා පොහොර සමාගම විසින් පොහොර බෙදාහරිනු ලබන නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන කිහිපයකට 2010 යල කන්නය තුලදී කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් පොහොර මෙට්‍රික් ටොන් 204.20 ක් නිසි අනුමැතියකින් තොරව නිකුත්කර තිබුණි.

### 2.2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සහනාධාර පොහොර මෙට්‍රික්ටොන් 155,733 ක් වෙනුවෙන් පිරිවැටුම් බදු ගෙවීම් සඳහා රජය විසින් සමාලෝචිත වර්ෂයේ පොහොර සහනාධාර යටතේ රු.9,935,765 ක් සමාගම වෙත ලබාදී තිබුණත් එම මුදලින් රු.8,535,379 ක් පළාත් සභා වෙත ගෙවා ඉතිරි රු.1,400,386 ක මුදල සමාගමේ ආදායමක් ලෙස රඳවාගෙන තිබුණි.

## 2.2.5 ආර්ථික නොවූ ගනුදෙනු

ආනයනය කල පොහොර තොගයක් සඳහා වූ ණය පියවීමට භාණ්ඩාගාරය විසින් 2010 ජූලි 06 දින රු.513,093,837 ක් සහනාධාර ලෙස ලබාදී තිබුණ ද එම ණය මුදල් 2010 ජූලි 08 දින පියවීම හේතුවෙන් දින 02 ක ප්‍රමාදය සඳහා ණය පොලිය ලෙස රු.312,657 ක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි.

## 2.2.6 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම සතු මෝටර් රථයක් 2010 ජූලි මාසයේ සිට ඌන උපයෝජිතව පැවතුනත් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6 වන ඡේදය ප්‍රකාර අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනිමට හෝ විකිණීමට කටයුතුකර නොතිබුණි.

(ආ) තොග සත්‍යාපන දිනය වන 2011 පෙබරවාරි 13 දින වන විටදී ඉතා සෙමින් චලනය වන රු.16,863,254 ක් වටිනා මෙට්‍රික් ටොන් 626.096 ක් වූ පොහොර තොගයන් ගබඩාවේ පැවතුණි.

## 2.2.7 හඳුනාගත් පාඩු

එක් සේවකයෙකුට පාරිතෝෂික දිමනාව ලෙස 2001 හා 2010 වර්ෂයන්හිදී රු.33,286 බැගින් දෙවරක් පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි.

## 2.2.8 වාහන උපයෝජනය

කෘෂිකර්ම අමාත්‍යංශයට අයත් වාහන 4 ක් වර්ෂ 10 කට අධික කාලයක සිට පොහොර සමාගම වෙත ලබාදී තිබූ අතර එම වාහන නිසි පරිදි පවරාගෙන නොමැති හෙයින් ආයතනයේ වත්කම් ලෙස හඳුනාගැනිමට කටයුතු කර නොතිබුණි.

## 2.2.9 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

2006 වර්ෂයේදී සකස් කරන ලද 2006 - 2011 දක්වා වූ සංයුක්ත සැලැස්ම 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර යාවත්කාලීන කර නොතිබුණු අතර වාර්ෂිකව සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම අතර විශාල වෙනස්කම් පැවතනි.

**2.2.10 විගණන හා කළමනාකරණ කමිටු පත්කිරීම සහ එහි ක්‍රියාකාරිත්වය**

2000 මාර්තු 15 දිනැති අංක PF/PE/7 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය සහ 2000 ජූලි 12 දිනැති අංක 1/A/1/2000/1 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා නොතිබුණි.

**2.2.11 අයවැය පාලනය**

අයවැයගත හා තත්‍ය සංඛ්‍යාවන් අතර සැලකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ණය අයකර ගැනීම

(ආ) අත්තිකාරම් ලබාදීම සහ පියවීම

(ඇ) විවිධ දීමනා ගෙවීම

(ඈ) වාහන පරිපාලනය

(ඉ) පොහොර බෙදාහැරීම සහ ප්‍රවාහනය